**ශීර්ෂය -159 සංචාරක අමාත්‍යාංශය**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

සංචාරක අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සංචාරක අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සංචාරක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ .සාධාරණ සහතිකවීම උසස් .මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. ප්‍රමාණාත්මක වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගනන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/3 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර වෙනස ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට පහක් හෝ රු.10,000 ක් යන වටිනාකමින් වැඩි වැය විෂයයන් සඳහා වෙනසට හේතු ACA -2 (ii) ආකෘතියේ දැක්විය යුතු වුවද, වැය විෂයයන් හයකට අදාලව විචලනයක් පෙන්නුම් කළ ඉතිරිවීම් රු.4,579,809 ක් සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි. | අතපසු වීමකින් අදාළ තොරතුරු ACA - (ii) ආකෘතියේ ඇතුළත් කර නොතිබුණි. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදුවීම වළක්වා ගැනීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී වාහන 02 කට සිදුවී තිබුණු අනතුරුවල ඇස්තමේන්තුගත වටිනාකම රු. 1,933,504ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල මුදල් රෙගුලාසි අංක 109යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ එය වාර්තාකර නොතිබුණි. | අනතුරු වලට අදාළ පරීක්ෂණ කටයුතු නිම වී නොතිබුණු බැවින් පාඩු හා අත්හැරීම් යටතේ මූල්‍ය ප්‍රකාශ වල දක්වා නොමැත. | අනතුරු වලට අදාළ පරීක්ෂණ කටයුතු නිම වී නොතිබුණ ද, සිද්ධි සංඛ්‍යාව හෝ ඉදිරි වර්ෂලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත හානි හා අත්හැරීම් හෝ එකී ප්‍රකාශනයේ වාර්තාකළ යුතු බව. |

## 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ රු. 2,831,533 ක වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්, ආදායම් නොවන ලැබීම් යටතේ දක්වා නොතිබුණි. | ප්‍රමාද දෝෂයකින් මග හැරී ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතු බව. |
| (ආ) | මුළු ආදායම් නොවන ලැබීම්වල එකතු වටිනාකම රු. 307,257,930 ක් විය යුතු වුවද, එය රු. 323,212,722 ක් ලෙස රු.15,954,792 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මුලු ආදායම් නොවන ලැබීම් වල එකතු වටිනාකම රු. 307,257,930 ක් විය යුතු අතර වැරදීමකින් එයට අග්‍රිම නොවන ලැබීම් රු.2,831,533 ක වටිනාකමද එකතු කර රු. 323,212,722 ක් ලෙස දක්වා තිබුණි. සිදු වූ ප්‍රමාද දෝෂය ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | -එම- |
| (ඇ) | වැය විෂයයන් පහකට අදාලව එකතුව රු.481,111ක වියදම් වැරදි වැය විෂයයන්හි වර්ගීකරණය කර වාර්තාකර තිබුණි. | පරිගණක සඳහා අවශ්‍ය මෘදුකාංග ඇතුළත් කිරීම එම යන්ත්‍රයේ වැඩි දියුණු කිරීමක් වන බැවින් යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ වැය විෂයය යටතේ ගිණුම්ගත කර ඇත.පරිගණක යන්ත්‍ර මිලදී ගෙන ඇත්තේ අමාත්‍යාංශ නිලධාරින් සඳහාය. වාර සේවා සහ ඉන්ධන අතපසු වීමකින් වැරදි වැය විෂයක් යටතේ සටහන් කර ඇති අතර මෙවැනි අතපසු වීම් ඉදිරියේදී සිදු නොවන පිණිස සටහන් කර ගතිමි.වාහන අලුත්වැඩියා කිරීම පුනරාවර්තන අලුත්වැඩියාවක් නොවන අතර දීර්ඝ කාලයකට බලපාන පරිදි සිදු කරන ලද අලුත්වැඩියාවක් බැවින් වාහන නඩත්තු කිරීම් යටතේ දක්වා ඇත. | -එම- |

## 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

### 1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් උපලේඛනයට අනුව ලී බඩුවල ආරම්භක ශේෂය රු.60,380 ක්ද, අපහරණය කිරීම් ලෙස රු.80,380ක්ද පෙන්වා තිබුණු නමුත්, එවැනි එකතු කිරීමක් හෝ ඉවත් කිරීමක් සිදු වී ඇති බව නිරීක්ෂණය නොවුණි. | වසර තුළදී මිලදීගත් මෙට්ට තොගයක් සඳහා වට්ටම් ලැබී තිබූ අතර වට්ටම් සහිත මිල රු. 60,380 ක් සැපයුම්කරුට ගෙවා මුලු වටිනාකම රු. 80,380 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. සිගාස් වැඩසටහන අනුව එම ගණුදෙනුව ගිණුම්ගත කිරීමේදී රු. 80,380 ක් අපහරණ තීරුව යටතේ හා රු. 60,380 ක් මිලදී ගැනීම් යටතේ සටහන් වී ඇත. නමුත් භෞතිකව අපහරණයක් සිදු වී නොමැත. | මූල්‍ය නොවන වත්කම් උපලේඛනය නිවැරදිව පිළියෙල කළ යුතු බව. |

### 1.6.2.2 මූල්‍ය වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බැංකු ගිණුම් පිළිබඳ 2021.12.31 දිනට තත්ත්ව වාර්තාවේ එදිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 6ට වැඩි චෙක්පත් වල සත්‍ය වටිනාකම රු. 301,981 ක් වුවද, එය රු. 104,560 ක් වශයෙන් රු. 197,421 ක් අඩුවෙන් දක්වා තිබුණි. | බැංකුවට ඉදිරිපත් නොවූ මාස 06 ට වඩා වැඩි චෙක්පත් වල වටිනාකම වැරදීමකින් අඩුවෙන් දක්වා ඇත. එවැනි දෝෂ ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරනු ලැබේ. | සත්‍ය වටිනාකම නිවැරදිව ඉදිරිපත් කළ යුතු බව. |

### 1.6.2.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය රු. 2,169,345 ක ඍණ අගයක් විය යුතු වුවද, එය රු. 13,785,447 ක් ලෙස දක්වා තිබුණි. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය අතපසු වීමකින් වැරදි අගයක් ලෙස දක්වා තිබූ අතර එම වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළයුතු බව. |
| (ආ) | අමාත්‍යාංශ පොත් අනුව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කල ශේෂ පිරික්සුමෙහි අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් පිළිවෙලින් රු.5,281,832 ක් සහ රු.5,344,800ක් වූ අතර භාණ්ඩාගාර 52 වගුවේ සඳහන් වටිනාකම අනුව එය පිළිවෙලින් රු.6,404,563ක් සහ රු.4,630,920ක් විය. මෙම වෙනස්කම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කල ශේෂ පිරික්සුම සිගාස් වැඩසටහන යටතේ ලබා ගෙන ඇත. ප්‍රමාද දෝෂයකින් රු . 1,222,731 ක වෙනස අග්‍රිම ගිණුමේ සඳහන් කර නොමැත. | අමාත්‍යාංශ පොත් අනුව සහ භාණ්ඩාගාර පොත් අනුව වෙනස්කම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ සටහන් කළ යුතු බව |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.307,257,927 ක් වුවද, එය රු.306,002,313ක් ලෙස ද, රු.234,681,856ක් වූ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.234,410,308ක් ලෙසද, රු.71,337,617ක් වූ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.71,592,005ක් ලෙසද වැරදියට දක්වා තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් වියදම් විෂයන්ගේ වියදම් සීමා කරන ලෙසට පැන වූ චක්‍රලේඛ වලට අනුගත වීම නිසා සමහර වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉතිරි වීම් සිදු වී ඇත. එසේ වුවද ඇස්තමේන්තු වල වෙන්කර ඇති මූලා ප්‍රතිපාදන මුදල් වර්ෂය තුළ වියදම් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව පෙනී යනවිට ඉතිරිවී ඇති ප්‍රතිපාදන වලින් මාරු කර ගැනීම මු.රෙ. 66 අනුව සිදුකර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළයුතු බව. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර රු.143,200ක වෙනසක් සැප්තැම්බර් මාසයේ සිට දක්නට ලැබුණු නමුත්, මාසිකව අමාත්‍යාංශ පොත් සහ භාණ්ඩාගාර පොත් සැසඳීම් නොකිරීම නිසා මෙම වෙනස 2021 දෙසැම්බර් 31 දිනට ද නිවැරදි කර නොතිබුණි. | අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂ සැසඳීමේදී දක්නට ලැබූ රු.143,200 ක මුදල ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය (437) විසින් වෙනත් අමාත්‍යාංශයක් වෙත බැර කල යුතු මුදලකි. වැරදීමකින් එම මුදල සංචාරක අමාත්‍යාංශය ශීර්ෂ අංකයට බැර කර තිබුණි. එම මුදල 2022 වර්ෂයේ මාර්තුමස ගිණුම් සාරාංශය මගින් නිරවුල් කර ඇත. | මාසිකව අමාත්‍යාංශ පොත් සහ භාණ්ඩාගාර පොත් සැසඳීම සිදුකළ යුතුබව. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ නිලධාරින් 11 කගේ ආපදා ණය ශේෂයන්හි ඇතුලත් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය සහ සාමාජික ණය ලේඛනය අතර එකතුව රු.433,410ක වෙනසක් විය. | විගණන නිරීක්ෂණය සමග එකග වෙමි. සාමාජික ණය ලේඛනය අනුව නිවැරදි ශේෂය දක්වා ඇත. කේවල ශේෂ වර්ගීකරණය යතුරු ලියනය කිරීමේදී ප්‍රමාද දෝෂයක් හේතුවෙන් සංඛ්‍යා වැරදියට මුද්‍රණය වී ඇත. මින් ඉදිරියට මෙවැනි දෑ සිදු නොවීමට සටහන් කර ගතිමි. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය සහ සාමාජික ණය ලේඛන ශේෂ අතර වෙනස්කම් නොපැවතිය යුතුබව. |
| (ඇ) | සාමාජික ණය ලේඛනවලට අනුව 2021 ජනවාරි 01 දින නිලධාරීන්ගෙන් අයවිය යුතු ආරම්භක ණය ශේෂයෙන් වාරික අය කිරීම් අඩු කළ පසු තවදුරටත් සාමාජික ණය ලේඛනයේ වර්ෂ අවසානයේ අයවිය යුතු ශේෂය ලෙස වාර්තා කළ අගයන් අතර රු.209,260 ක අංක ගණිතමය වෙනසක් පැවතුණි. | අදාල වෙනස්කම් සාමාජික ණය ලේඛනයේ නිවැරදිව සටහන් කර ගතිමි. | අංක ගණිතමය දෝෂ ඉවත් කළ යුතුබව. |

**1.6.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද එවැනි සමාලෝචනයන් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මීට අදාළ සටහන මූල්‍ය ප්‍රකාශවල “ඒසීඒ-පී” ආකෘතියේ සටහන් කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාශය විසින් සැලසුම් කල අග්‍රිමය රු.මිලියන 574.3ක් වූ අතර ලැබුණු අග්‍රිම ප්‍රමාණය රු.මිලියන 294.5 ක් වූ බැවින් ලද අග්‍රිමය වාර්ෂික සැලසුමෙන් සියයට 51 ක පමණ ප්‍රමාණයක් වී තිබුණි. මාසිකව සැලසුම් කල හා ඉල්ලුම් කල අග්‍රිම වටිනාකම් පරීක්ෂාකිරීමේදි 2021 දෙසැම්බර් මාසය සඳහා සැලසුම් කල අග්‍රිමය රු.මිලියන 56.8ක් වූ අතර ඉල්ලුම් කල ප්‍රමාණයරු.මිලියන 94.5 ක් වී තිබුණි. | රටේ පැවති මූල්‍ය දුෂ්කරතාවය හේතුවෙන් මහා භාණ්ඩාගාරය විසින් සීමාසහිතව අත්‍යවශ්‍ය කාර්යයන් වෙනුවෙන් පමණක් අග්‍රිම නිකුත් කිරීම සිදු කිරීම නිසා මෙම වෙනස පැන නැගී ඇත. වසරේ බොහෝ කාලයක් කාර්යාල වසා තිබූ බැවින් හා වසර අවසානයට පෙර බිල්පත් පියවීම කළයුතු නිසා දෙසැම්බර් මාසයේදී ගෙවීම් කිරීම සඳහා විශාල බිල්පත් ප්‍රමාණයක් ලැබුණු බැවින් ඒවා පියවීමට අදාළව ප්‍රතිපාදන වලට යටත්ව අග්‍රිම ඉල්ලුම් කිරීම සිදු කරන ලදී. | අග්‍රිම සැලසුම් කිරීම විධිමත්ව සිදුකළ යුතු බව. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදි අවශ්‍යතාවන් හඳුනා ගෙන නිශ්චිත සැලසුමක් යටතේ ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා වැය විෂයයන් 20 කට අදාලව සියයට 05 සිට සියයට 88 ක් දක්වා පරාසයක රු. 15,838,637 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිවසේ සිට වැඩ කිරීම, විදේශ ගමන් සීමා වීම වැනි හේතු නිසා ඇතැම් පුනරාවර්තන වියදම් වල අඩුවීමක් සිදු වීම, ආරම්භ කර නොමැති ව්‍යාපෘති ආදිය තාවකාලිකව අත්හිටුවන ලෙස උපදෙස් ලබාදුන් බැවින් සමහර ප්‍රාග්ධන වියදම් වල ප්‍රතිපාදන ඉතිරි වී තිබීම ආදීහේතු මත ප්‍රතිපාදන වල ඉතුරු වීම් සිදු වන ලදී. | අවශ්‍යතාවන් හඳුනා ගෙන නිශ්චිත සැලසුමක් යටතේ නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. |
| (ආ) | වැය විෂයයන් 13 ක මූලික වියදම් ඇස්තමේන්තුවට වඩා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සියයට 4 සිට සියයට 138 ක අගය පරාසයක වැඩියෙන්ද, වැය විෂයයන් 24 ක මූලික වියදම් ඇස්තමේන්තුවට වඩා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සියයට 4 සිට සියයට 100 ක අගය පරාසයක අඩුවෙන්ද දක්වා තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් වියදම් විෂයන්ගේ වියදම් සීමා කරන ලෙසට පැන වූ චක්‍රලේඛ වලට අනුගත වීම නිසා සමහර වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉතිරි වීම් සිදු වී ඇත. එසේ වුවද ඇස්තමේන්තු වල වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන මුදල් වර්ෂය තුළ වියදම් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව පෙනීයන විට ඉතිරි වී ඇති ප්‍රතිපාදන වලින් මාරුකර ගැනීම මු.රෙ. 66 අනුව සිදුකර ඇත. | -එම- |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 18 ක් සහ මූලධන වැය විෂයයක් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් පිළිවෙලින් රු.92,293,000 ක් සහ රු.12,420,000 ක් ද වශයෙන් එකතුව රු.104,713,000 ක අතිරේක ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි. එම ප්‍රතිපාදන මාරු කිරීම් ප්‍රතිශතය මුල් ඇස්තමේන්තු මුදලට සාපේක්ෂව බැලූ විට සියයට 3 සිට සියයට 100 ක පරාසයක අගයන් වීම හේතුවෙන් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර නොමැති බව අනාවරණය විය. | - එම - | අවශ්‍යතාවන් හඳුනා ගෙන නිශ්චිත සැලසුමක් යටතේ නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වර්ෂය අවසානයේදි ඇස්තමේන්තුගත මුදලින් තවදුරටත් ප්‍රතිපාදන ඉතිරිව ඇත්නම් පමණක් බැදීම්වලට එළඹිය යුතු වුවත් අමාත්‍යාංශයේ වැය විෂයයන් 12 ක ඉතිරිය ඉක්මවා එකතුව රු.6,322,913 ක් වූ බැරකම්වලට එළඹ තිබුණි. | අමාත්‍යාංශයේ වැය විෂයන් 12 ක් යටතේ සිදු කරනු ලැබූ ගෙවීම් අනිවාර්යෙන් කළයුතු අත්‍යවශ්‍ය හා වැදගත් වියදම් කීපයක් දැරීම නිසා ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇති වූ අතර ඉදිරියේදී එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල බැදීම් හා බැරකම් ප්‍රකාශය යටතේ දක්වා නොතිබුණු රු. 790,247 ක බැරකම් 2022 වර්ෂයේ දී නිරවුල් කර තිබුණි. | බැදීම් හා බැරකම් ලෙස ඇතුළත් කළ යුතු රු. 790,247 ක වටිනාකම බැදීම් හා බැරකම් ලේඛනයේ සටහන් කිරීම අතපසු වීමකින් මගහැරී ඇත. | මූල්‍ය ප්‍රකාශන වල බැදීම් හා බැරකම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළයුතු බව. |
| (ඇ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/3 දරන චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව බැදීම් හා බැරකම් බැදීම් අංක අනුව සටහන් කළ යුතු වුවද ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව බැදීම් 116 ක් එපරිදි අංක කර නොතිබුණි. | අතපසු වීමකින් සටහන් කර නොතිබූ අතර එම වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය අවසන් වී දින 10 ක් තුල පියවිය යුතු වුවත්, අවස්ථා 4 කදී ලබාගත් රු.133,000 ක අත්තිකාරම් පියවීම. දින 35 ක සිට දින 72 ක් දක්වා කාලපරාසයක ප්‍රමාදයකින් පියවා තිබුණි. තවද, ලබාගත් අත්තිකාරම් පියවීමට පෙර අවස්ථා 7 කදී රු.194,000 ක අත්තිකාරම් නැවත නිකුත් කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල වසා තිබූ බැවින් හා නිලධාරීන් කඩින් කඩ සේවයට ගෙන්වීම නිසා නියමිත කාලය තුළදී අත්තිකාරම් පියවීම ප්‍රමාද වූ නමුත් එම වටිනාකම් වසර අවසානයේදී පියවා ඇත. අමාත්‍යාංශයේ හා අමාත්‍ය කාර්යාලයේ අත්‍යවශ්‍ය හා හදිසි රාජකාරි කටයුතු වෙනුවෙන් අග්‍රිම පියවීමට පෙර නැවත අග්‍රිම නිකුත් කිරීමට සිදු වූ අතර එම අග්‍රිම හැකි ඉක්මණින් පියවීමට කටයුතු කරන ලදී. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වළක්වා ගැනීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි අංක 104(4) | 2021 ඔක්තෝබර් 22 දින හදිසි අනතුරකට ලක්වූ ජීප් රථය සම්බන්ධයෙන් අනතුරින් මාස තුනක් ඇතුලත අලාභහානිය පිළිබදව පූර්ණ වාර්තාවක් සකස් කල යුතු වුවද, විගණන දිනය වූ 2022 මාර්තු 15 දින වනවිටත් එකී වාර්තාව සකස් කර නොතිබුණි. | WP KY- 7243 රථයට අදාළ මු රෙ. (3)104යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව2021.10.27 දින ඉදිරිපත් කරන ලදි. අනතුරට අදාල රථයේ අවසන් වාර්තාව ලබාගෙනඅදාළ අලාභය ගණනය කිරීම සඳහා වාහනය අලුත්වැඩියා කර අවසන් විය යුතු බැවින් අවසන් වාර්තාව සකස් කිරීමට නොහැකි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි අංක 395 (ඇ) | සෑම මාසයකටම අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ ඊලඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වුවත් 2021 වර්ෂයට අදාල මාස 9 ක බැංකු සැසඳුම් ප්‍රකාශනයන් විගණනයට ඉදිරිපත් කිරීමේදී දින 30ක සිට දින 105ක් දක්වා ප්‍රමාදයකින් ඉදිරිපත් කර තිබුණි. | රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිවසේ සිට රාජකාරි සිදු කිරීම හා සීමා සහිතව නිලධාරින් කාර්යාලයට ගෙන්වීම සහ 2021 ඔක්තෝම්බර් මාසයේදී අදාළ විෂය නිලධාරිනිය ස්ථාන මාරු ලබා ඒ වෙනුවට නවක නිලධාරියෙකු පැමිණීම වැනි කරුණු හේතුවෙන් බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයන් සිදු විය. 2022 වර්ෂයේ සිට අදාළ පරිදි බැංකු සැසඳුම් පිළියෙළ කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| (iii) | මුදල් රෙගුලාසි අංක 396 | 2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ දිනෙන් මාස 08 ක සිට මාස 13 ක් දක්වා පැරණි ගෙවීමට ඉදිරිපත් නොවූ රු.301,981 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් යොමුගත වගන්ති ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | මෙම චෙක්පත්අවලංගු කර නව චෙක්පත් නිකුත්කිරීම හෝ චෙක්පත්වල කාලය දීර්ඝ කිරීම සිදුකර ඇත. | -එම- |
| (ආ) | 2006 පෙබරවාරි 21 දිනැති අංක CSA/2/3/4 දරන ජනාධිපති චක්‍රලේඛය | (i) අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයා එකවර විදේශ ගමන්හි නොයෙදිය යුතු බවට දන්වා තිබුණද 2021 ,ඔක්තෝබර් 05 සිට 08 දක්වා ප්‍රංශයේ පැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා එම දෙදෙනාම සහභාගි වී තිබුණි. | 2021.10.03 දින සිට 2021.10.12 දින දක්වා ප්‍රංශයේ ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා එවකට සංචාරක අමාත්‍යතුමා සමඟ එවකට එම අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු පිරිසක් සහභාගී වීමට නියමිතව තිබුණි. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කළ තිබු ඉහත චක්‍රලේඛය අනුව විදේශ චාරිකාවකට කණ්ඩායමක් සහභාගි වන විට එම කණ්ඩායමේ ජොෂ්ඨතම සමාජිකයාගේ විදේශ | -එම- |

| | | | |
|---|---|---|---|
| | | නිවාඩු අනුමත කිරීමේ බලධාරියාගෙන් කණ්ඩායමේ සියලු දෙනාගෙන් අනුමැතිය ලබා ගත යුතුය. ඒ අනුව දිවයිනෙන් බැහැර වීමට 2021.09.30 දිනැතිව සංචාරක අමාත්‍යතුමා විසින් කරන ලද ඉල්ලීමට 2021.10.01 දින අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමැතිය ලබා දී ඇත. | |
| (ii) | විදේශ ගමන් සඳහා සහභාගීත්වය අවම විය යුතු බවට දැනුම් දී තිබුණද , සංචාරක උපදේශක ස කමිටුවේහ සම්බන්ධීකාරක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ද ඉහත සංචාරයට සහභාගී වී තිබුණි. | සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ විෂය පථයට අයත් බැවින් එවැනි වැඩසටහන් සඳහා වැය වන වියදම් මෙතෙක් කලක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය මඟින් දරා තිබුණි. එබැවින් ඉහත සංචාරය සඳහාද එලෙසම කටයුතු කර ඇත. | -එම- |
| (iii) | ලංකාව සංචාරය සඳහා විවෘත බවට ප්‍රංශ සංචාරක ආයතන වලට දැනුම් දීම සඳහා 2021 ඔක්තෝබර් 06 දින ප්‍රවර්ධන සන්ධ්‍යාවක් (Promotional Evening) පැවැත්වීමට සැලසුම් කර පසුව එය අවලංගු කර තිබුණි. එහෙත් අමාත්‍යවරයාගේ උපදෙස් මත එදින එම සන්ධ්‍යාව නොපවත්වා 2021 නොවැම්බර් 09 දින නැවත පවත්වා තිබුණි. ඒ සඳහා සංචාරක අමාත්‍යවරයා, සංචාරක උපදේශක කමිටුවේ සම්බන්ධීකාරක සහ ප්‍රවර්ධන කාර්යාංශයේ නිලධාරියෙක් සහභාගි වී තිබුණි. | -එම - | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2010 මැයි 14 දිනැති අංක සීජ් 1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ ''රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛනය'' | (i) | අමාත්‍යවරයාගේ සහාය කාර්යය මණ්ඩලයේ අතිකාල දීමනා හිමිකම් ඇති නිලධාරින් සංඛ්‍යාව ඉක්මවා කාර්යය මණ්ඩලයට අයත් නොවන පුද්ගලයින් දෙදෙනෙකුට ද සමාලෝචිත වර්ෂය තුළ රු. 663,918 ක අතිකාල දීමනාවක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට අයත් වූවද ඔවුන්ගේ රාජකාරි ස්වාභාවය අනුව ගරු සංචාරක අමාත්‍යවරයා සහභාගීවන රැස්වීම් / සාකච්ඡා /වැඩසටහන් ආවරණය කළ යුතු බැවින් ඔවුන් අමාත්‍ය කාර්යාලයේ රැඳීසිටිය යුතුය. එබැවින් ඔවුන්ගේ අතිකාල ඉල්ලීම් ද ඉදිරිපත් කිරීමේදි ඒවා අමාත්‍ය කාර්ය මණ්ඩලයේ අතිකාල ඉල්ලීම් සමඟ අමාත්‍යාශය වෙත ඉදිරිපත් කර ඇත. | -එම- |
| | | (ii) | අමාත්‍යාංශය සහ ඒ යටතේ පවත්නා සියලුම ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හෝ රාජ්‍ය සංස්ථාවලට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යා යුතු බව දැනුම් දී තිබුණ ද ,සංචාරක අමාත්‍යාංශය යෝර්ක් වීදියේ, ඇසෙට් ආකේඩ් නම්වූ පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන ගොස් තිබුණි. තවද අමාත්‍ය කාර්යාලය ඉහත ගොඩනැගිල්ලේ හෝ ස්ථානගත නොකර ලෝක වෙළද මධ්‍යස්ථානයෙන් ලබාගත් කාර්යාලයක කුලියට පවත්වාගෙන ගොස් තිබුණි. දරා ඇති කුළී වියදම රු.43,317,720 ක් විය. | සංචාරක අමාත්‍යාංශය සඳහා සෙත්සිරිපාය I හෝ II අදියරෙන් ඉඩ පහසුකම් වෙන් කර දීමට හැකියාවක් පවතීද යන්න පිළිබඳව MT/ ADM/01/12(iv) හා 2020.09.15 දිනැති ලිපිය මගින් විමසන ලද අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ MUD/ ADM/ EST 03/ General-01 හා 2020.09.18 දිනැති ලිපියෙන් දන්වා ඇත. 2020.10.19 දිනැතිව ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 2020.12.15 දින සිට සංචාරක අමාත්‍යාංශය අංක ඊ 51, යෝක් වීදිය, කොළඹ 01 යන ස්ථානයට රුගෙන යන ලදී. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ<br>------------------ | | | |
| (i) | 2006 නොවැම්බර් 18දිනැති අංක 19/2006 දරන චක්‍රලේඛය | බස්නාහිර පලාත් මහ ඇමති නිල නිවස තාවකාලික පදනමින් අමාත්‍යවරයා වෙත ලබාදී තිබුණු අතර මාස 11 ක් සඳහා එමනිල නිවස වෙනුවෙන් අමාත්‍යාංශය විසින් ජල පරිභෝජනය සඳහා රු13,715.ක සිට රු 71,118.ක් දක්වා පරාසයක වියදම් දරා තිබුණි. තවද විදුලි පරිභෝජනය සඳහා එම කාලපරිච්ඡේදය තුළ රු 2,328.ක සිට රු 258,753.ක් දක්වා පරාසයක ද වියදම් දරා තිබුණි. | මෙම නිවාස රජය සතු . නිවසක් වන බැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2006/22 අනුව අමාත්‍යවරයාගෙන් 12.5% ක මුදලක් නිවාස කුලිය ලෙස අයකර ඇත. | -එම- |
| (ii) | 2010 මැයි 24 දිනැති අංක 2010/80දරන චක්‍රලේඛය | • මාධ්‍ය ලේකම්ට ලීටර් 218 ක් වශයෙන් සපයා ඇති නිල වාහනය වෙනුවෙන් ලබා ගත හැකි මාසික ඉන්ධන දීමනාවට අමතරව රු. 40,549 ක දීමනා ගෙවා තිබුණි. | හිටපු ගරු අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම් සඳහා මාසික ඉන්ධන දීමනාවට අමතරව කිසිදු ගෙවීමක් සඳහා වවුචරපත් පාලන අංශය මඟින් ඉදිරිපත් කර නොමැති බව කාරුණිකව දන්වමි . | ගිණුම් අංශය සමගද පරීක්ෂාවකින් පසුව පිළිතුරු ලබාදිය යුතු අතර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| | | • අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්ගේ රියදුරුට මසකට උපරිම අතිකාල පැය 125 ක්ද සම්බන්ධීකරණ ලේකම්, මාධ්‍ය ලේකම් සහ මහජන සම්බන්ධතා නිලධාරි යන නිලධාරින්ගේ රියදුරන්හට මසකට උපරිම අතිකාල පැය ක් ද100, අනුමත කොට තිබුණි. එම උපරිම සීමාව ඉක්මවා වියදම් දැරීම හෝ ඒ සඳහා වැය කරන වියදම් ප්‍රතිපූර්ණයට බිල්පත් ඉදිරිපත් නොකරන ලෙස අවධාරණය කර තිබුණි . කෙසේ වුවද එකී | 2020 වර්ෂය තුළ කොවිඩ් ව්‍යාපතිය සමඟ මෙරටට සංචාරය සඳහා සංචාරකයින්ගේ පැමිණිම අඩාලවූ අතර 2021 වර්ෂයේදී සංචාරක කර්මාන්තයෙන් උපයන වාර්ෂික ආදායම වර්ධනය කරගැනිම සඳහා, අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති වැඩසටහන් සහ ක්ෂේත්‍ර චාරිකා සඳහා අමාත්‍යවරයාගේ | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | රියදුරන්ට අනුමත උපරිම පැය සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂය තුළදී පැය ක් සඳහා 1500 රු.167,943 ක් ගෙවා තිබුණි. | පෞද්ගලික ලේකම්, මාධ්‍ය ලේකම්, සම්බන්ධීකරණ ලේකම්, මහජන සම්බන්ධතා නිලධාරී යන නිලධාරීන් සහභාගී විය. එබැවින් එම නිලධාරීන් සඳහා අනුයුක්ත කර ඇති රියදුරන්ද අදාළ අවස්ථාවන් සඳහා රාජකාරියේ යොදවා ඇත. එබැවින් අතිකාල දීමනා ගෙවීමට සිදුවිය. අමාත්‍යාංශයේ ලේකමේග් අනුමැතිය පරිදි උපරිමයන්ට යටත්ව අතිකාල ගෙවා ඇත. | |
| (iii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන චක්‍රලේඛය | • සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12ක කාලසීමාවකින්ම පසුව හෝ කි.මී.25000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කලයුතු වුවත් විගණිත දිනය වන 2022මාර්තු 16 දින වන විටත් වාහන 15ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සමහරවාහන 2022.01.15 දිනවන විටත් 25000 km සම්පූර්ණ කර නොතිබූ බැවින් ඉන්ධන පරීක්ෂාව සිදුනොකළ අතර WP CAV – 4004 රථය අමාත්‍යාංශයට භාරගත් දින සිට අලුත්වැඩියාව සඳහා යොමුකර ඇති බැවින් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොමැත .අනෙක් වාහන සඳහා ඉන්ධන පරීක්ෂාව ඉන්ධන ලබාගැනීමට හැකි වූ විගස සිදුකිරීමට නියමිතය. | -එම- |
| | | • ඉන්ධන ප්‍රමාණය හා ධාවනය කරන ලද දුර ප්‍රමාණය ලොග් සටහන් පොතේ දිනපතාම ඇතුලත් කල යුතු වුවද වාහන 15කට අදාල පරිදි කටයුතු කර නොතිබුණි. | වාහන 15 පසුගිය වසර තුළ පැවැති කොවිඩ් තත්වය නිසා ( 2021) ධාවනය කරන ලද්දේ මසකට සීමිත දින ප්‍රමාණයක් බැවින් එම දින ප්‍රමාණයක් පමණක් ධාවන සටහන් ලොග් පොත්වල සටහන් කර ඇත. | -එම- |

**2.6 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංවර්ධන උපාය මාර්ග සහ අන්තර්ජාතික වෙළඳ අමාත්‍යාංශයට අයත්ව තිබියදී, 2019 නොවැම්බර් 24 දින හදිසි අනතුරකට ලක් වී තිබුණු ජීප් රථය අළුත්වැඩියාව සඳහා ඩීසල් ඇන්ඩ් මෝටර් ඉන්ජිනියරින් පී .එල් .සී සමාගම වෙත රු.20,816,808 ක පිරිවැයකට අළුත්වැඩියාව සඳහා යොමු කර තිබිය දී, 2021 ජූලි 22 වන දින සංචාරක අමාත්‍යාංශ ලේකම් නමට පවරා ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද, රක්ෂණ ආයතනයට අනුව මෙම රථයේ වෙළඳපල වටිනාකම වන රු.15,500,000 ක මුදලකට ගර්හිත කිරීම හෝ අලුත්වැඩියාව සම්පූර්ණ කිරීම සඳහා රු.9,300,000 ක මුදලක් පමණක් ගෙවීමට හැකිබව අමාත්‍යාංශය වෙත දන්වා තිබුණු බැවින් හිඟ අලුත්වැඩියා වියදම් වටිනාකම රු.11,516,808 ක වගකීමක් අමාත්‍යාංශයට භාර ගැනීමට සිදු වී තිබුණි. | රථයේ වෙළඳපොළ වටිනාකම සහ අලුත්වැඩියාව සඳහා ඉදිරිපත් කළ ඇස්තමේන්තුව අනුව රථය අලුත්වැඩියා කිරීම ලාභදායි බැවින් කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය මඟින් රථය අලුත්වැඩියාව සඳහා යොමුකර ඇත.ජාතික රක්ෂණභාර අරමුදල විසින් මෙම රථය ගර්හිත කිරීමට දන්වා ඇත්තේ 2021.10.12 දිනදීය. රථය සංචාරක අමාත්‍යාංශයට පවරා ගන්නා අවස්ථාව වනවිට අලුත්වැඩියා කිරීමට යොමුකර තිබුණි. | අමාත්‍යාංශයට සිදුවිය හැකි අලාභය අවම කිරීම සඳහා කටයුතු කළයුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 මැයි 12 දිනැති අංක පීඑෆ්/ආර්ඩී/ආර්ජී/02/සීසී/01/2021 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය පරිදි 2020 වාර්ෂික කාර්යයසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට 2021 ජුනි 30 දින දක්වා කාලය දීර්ඝ කර දී තිබුණු අතර අමාත්‍යාංශය විසින් 2020 වාර්ෂික කාර්යයසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2021 අගෝස්තු 16 දිනදීය. | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සංචරණ සීමා පැවතීම නිසා කාර්ය මණ්ඩලය කඩින් කඩ සේවයට වාර්තා කළ අතර එවැනි අවස්ථා වල සිදුවූ ප්‍රමාදයන් මේ සඳහා බෙහෙවින් හේතු වූ අතර ඉදිරියේදී එවැනි ප්‍රමාදයන් අවම කරගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

## 3.2 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------------- | ------------ |
| (අ) | අනතුරට ලක්වී තිබුණු වාහනයක අලුත්වැඩියා කටයුතු නියෝජිත ආයතනයකින් සිදුකරන ලෙස 2021 ඔක්තෝබර් 26 දින සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබියදී, ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කිරීමකින් තොරව, වෙනත් පෞද්ගලික ගරාජයකට මෙම වාහනයේ අලුත්වැඩියාව පවරා ඒ වෙනුවෙන් රු.1,492,754ක පිරිවැයක් දරා තිබුණි. එය ටොයෝටා ලංකා (පුද්) සමාගමේ ඇස්තමේන්තුවට වඩා රු.222,592ක වැඩි මිලක් විය. | නියෝජිත ආයතනයට වඩා ඉක්මනින් අලුත්වැඩියාව සිදුකර ගත හැකි බැවින් පෞද්ගලික ආයතනයක් වෙත අලුත්වැඩියාව සිදුකර ගැනීම සඳහා යොමුකළ අතර පසුව වාහනය ගලවා අලුත්වැඩියාවන් සිදුකිරීමේදී නැවත ඇස්තමේන්තු 3 ක් ඉදිරිපත් කරන ලදී .එම අවස්ථාවේ දී නැවතත් වෙනත් ආයතන වෙත ඇස්තමේන්තු ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ නොහැකි විය.<br><br>තවද මෙම රථයේ අනතුරෙන් පසු අලුත්වැඩියාව සඳහා රැගෙන යන ලද්දේ ආපදා රථයක බැවින් ප්‍රසම්පාදනය සඳහා වාහනයට අදාළ ඇස්තමේන්තු ලබාගැනීමට ආයතන වෙත රැගෙන යාමට අවස්ථාවක් නොමැති විය. | විධිමත් ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළයුතු බව. |
| (ආ) | අමාත්‍යාංශයේ කැබ්රථයක් අලුත්වැඩියාව කිරීම සඳහා 2021 ජූලි 09 දින මිලගණන් කැඳවා තිබුණු නමුත්, මිල ගණන් ඉදිරිපත් වූ ආයතන 2න් 2021 ජූනි 25 සහ 2021 ජූලි 05 දිනවලදී මිල ගණන් ඉදිරිපත් වීම හේතුවෙන් මිල ගණන් කැඳවීමට පෙර මිල ගණන් ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් කල් ඇතුව අදාළ ආයතනවලට සන්නිවේදනය වී ඇති බව ද නිරීක්ෂණය විය. | අදාළ කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීමට පෙර රියදුරු විසින් අදාළ රථය එම ආයතන ලවා පරීක්ෂා කරවාගෙන ලබාදුන් මිල ගණන් ලිපි ගොනුවේ අමුණා තිබූ අතර එම ආයතන වෙතින් අලුත්වැඩියාව සිදුකර නොමැති බව කාරුණිකව දන්වමි. | -එම- |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කැබිරථයක් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් වර්ග 05 ක් 2021 නොවැම්බර් 17 දින නියෝජිත ආයතනයකින් රු.169,891 ක් ගෙවා මිලදී ගෙන තිබුණද , විගණන දිනය වූ 2022 අප්‍රේල් 05 දින වන විටත් අලුත්වැඩියා නොකොට අමාත්‍යාංශ ගබඩාවේ රඳවා තිබුණි. | මේ වනවිට එම අමතර කොටස් භාවිතා කර අලුත්වැඩියාව සිදුකර ඇත. | අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වාගත යුතුබව. |
| (ආ) | බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ නිල නිවස සංචාරක අමාත්‍යවරයාට තාවකාලික පදනමින් ලබා දී තිබූ අතර එම නිල නිවස සඳහා රු.874,960ක් වැය කර සෝපා සෙට්, ඇඳන් ආදිය භාණ්ඩ මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, සංචාරක අමාත්‍යවරයාට වෙන් කර දී තිබුණු නිල නිවස අලුත්වැඩියාව වෙනුවෙන් රු.මිලියන 9 ක ඇස්තමේන්තු ගත මුදලක් අවශ්‍ය බවත් ඒ හේතුව නිසා එය පදිංචියට නුසුදුසු බවත් සඳහන් කරමින් අමාත්‍යවරයා විසින් තමාට හිමි නිල නිවස ප්‍රතික්ෂේප කලද, එම නිල නිවසම 2021 ජුනි 29 වන දින වන විට රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් අධිකරණ අමාත්‍යවරයාට පදිංචියට ලබා දී තිබුණි. | එම අලුත්වැඩියා කටයුතු සිදු කර අවසන් වන තුරු වෙනත් නිවාසයක් කුලී පදනම මත ලබාගැනීමට ගරු අමාත්‍යවරයා අපේක්ෂා කළ බැවින් , බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති නිල නිවාසය සංචාරක අමාත්‍යවරයා වෙත ලබාදෙන ලෙසට බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත MT/ADM/01/12 (V) හා 2021.01.18 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. නිල නිවසෙහි පැවැති භාණ්ඩ බස්නාහිර පළාත් සභාවට අයත් ඒවා බැවින් ගරු සංචාරක අමාත්‍යවරයා විසින් ඉවත් කරන ලද භාණ්ඩ නැවත එම පළාත් සභාව වෙත භාර දී ඇත.<br><br>තව ද ස්ටැන්ඩ් එක සහිත ඕගන් එක හිටපු අමාත්‍යවරයා සතු පුද්ගලික භාණ්ඩයක් වන බැවින් එය සුදුසු ළමා හෝ වැඩිහිටි නිවාසයකට භාර දීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. මෙම භාණ්ඩ ඉවත් කිරීම සහ වෙනත් ආයතන වෙත භාරදීම බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ,ආර්ථික ප්‍රවර්ධන , විදුලිබල හා බලශක්ති , පරිසර කටයුතු , ජල සම්පාදන හා ජලාපවාහන සහ | තාවකාලික පදනමෙන් ලබා දී තිබුණු නිල නිවස සඳහා නව මිලදීගැනීම් හෝ නිල නිවසෙහි පැවැති භාණ්ඩ ඉවත්කිරීම සිදුනොකළ යුතුබව. |

සංචාරක කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකර ඇත.

### 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය , භාර ගැනීම හෝ භාරව සිටීම, නැතහොත් රජයේ මුදල්, මුද්දර නැතහොත් බඩු බාහිරාදිය බෙදා හැරීම හෝ නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු නිලධාරීන් ද , රජයේ ගිණුමට අදාල වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, අමාත්‍යාංශයේ නිලධාරීන් 18 ක් එසේ ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කර ඇති අතර මේ වනවිටත් ඒ සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

### 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 සහ 2020 වර්ෂවලදී වාහන තුනකට සිදුවී තිබුණු රු.25,196,889 ක පිරිවැය ඇස්තමේන්තුවක වාහන අනතුරුවලට අදාලව රු.22,052,349 ක මුදලක් විගණන දිනය වූ 2022 අප්‍රේල් 05 දින වන විටත් අදාල රක්ෂණ ආයතවලින් අයවී නොතිබුණි. | 2019 හා 2020 වර්ෂවලදීවාහන තුනකට සිදුව ඇති අනතුරු සම්බන්ධයෙන් රු. 22,052,349 මුදලක් හානි පාඩු වශයෙන් අයකර ගැනීමට අදාල තොරතුරු පාලන අංශය මඟින් නඩත්තු කරන ගොනුවල සඳහන්ව නොමැත. | අනතුරු සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වාගත යුතු බව. |